1st Place Winner
National Productivity
Award 2020

SLSI SYSTEM ISO 9001 CERTIFIED

SLAB ACCREDITED
ISO/IEC 17021
QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
# பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
# CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref. : CSS/2/9//DO/OTHER | ඔබේ අංකය / உமது இல / Your Ref. : | දිනය / திகதி / Date : 2022.11. 25 |

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු/ අමාත්‍යාංශ ලේකම්වරු,
සියලුම දෙපාර්තමේන්තුගත ප්‍රධානීන්, ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

**<u>දකුණු පළාත් සභාවෙන් වැටුප් ගෙවීමේ පදනම මත වෙනත් පළාත් සභා සඳහා තාවකාලික අනුයුක්ත කිරීම අත්හිටුවීම</u>**

වියදම් කළමනාකරණය සම්බන්ධයෙන් දකුණු පළාත් සභාව කටයුතු කරන ආකාරය අනුව, තාවකාලික පදනම මත වෙනත් පළාතක සේවය කිරීම සඳහා වැටුප් ගෙවීම ගැටලුවක් බව නිරීක්ෂණය වේ.

02. දකුණු පළාත් සභාව මඟින් වැටුප් ගෙවීමේ පදනම යටතේ වෙනත් පළාත් සභාවන් සඳහා තාවකාලික අනුයුක්තයන් ලබා දීම **2022.11.20** දින සිට ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවීමටත්, දැනටමත් මෙම සහනය භුක්ති විඳින නිලධාරීන් හට ලබා දී ඇති කාල සීමාව දීර්ඝ නොකිරීමටත්, මේ වන විට ලබා දී ඇති කාල පරිච්ඡේදය අවසන් වූ පසුව අප පළාත් සභාවේ නියමිත සේවා ස්ථානය වෙත රාජකාරී සඳහා වාර්තා කළ යුතු බවට ඔවුන්ට දැනුම් දීමටත්, ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් පරිදි දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/3/3/TR/18 හා 2022.11.21 දිනැති ලිපිය මඟින් මා වෙත දැනුම් දී ඇත. (ඇමුණුම 01)

03. කෙසේ වෙතත්, එවැනි නිලධාරීන් අපහසුතාවයට පත් වීම වැළැක්වීම සඳහා පහත සඳහන් විකල්ප ක්‍රියාමාර්ග තුන භාවිතා කළ හැකිය.

I. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2021 අනුව සංවර්ධන නිලධාරීන්, ඒකාබද්ධ සේවය යටතේ සංවර්ධන නිලධාරී සේවයේ තනතුරක් සඳහා ස්ථාන මාරු කිරීම.
II. සුහද මාරු ක්‍රමය යටතේ ස්ථාන මාරු ලබා දීම.
III. අදාළ පළාත යාබදව පිහිටා ඇත්නම්, පළාත මායිමට ආසන්න සේවා ස්ථානයක් වෙත ස්ථාන මාරු ලබා දීම.

04. ඒ අනුව, ඉහත පරිදි කටයුතු කරන ලෙස ඔබ අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

සුමිත් අලහකෝන්,
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary : 091 4944002
කාර්යාලය / காரியாலயம் / Office : 091 4119011, 091 2234052
ෆැක්ස් / பெக்ஸ் / Fax : 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail : chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இ தளம் / Web site : www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

"සෞභාග්‍යමත් දකුණු පළාතක්"

"ජනතා හිතවාදී හා වගකීම් සහිත රාජ්‍ය සේවයක් උදෙසා"

# ආණ්ඩුකාර ලේකම් කාර්යාලය - දකුණු පළාත
# ஆளுநர் செயலகம் - தென் மாகாணம்
# Governor's Secretariat - Southern Province

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Number: G/SP/3/3/TR/18 | ඔබේ අංකය / உமது இல. / Your Number: | දිනය / திகதி / Date: 2022/ 11/ 21 |

ලැබුණා
22 NOV 2022

ලැබුණා.
2/9
2022 | 11 | 22
පිරිස් අංශය

ප්‍රධාන ලේකම්,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
දකුණු පළාත.

**<u>දකුණු පළාත් සභාවෙන් වැටුප් ගෙවීමේ පදනම මත වෙනත් පළාත් සභා සඳහා තාවකාලික අනුයුක්ත කිරීම අත්හිටුවීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ අංක CSS/2/9/DO/OTHER හා **2022.11.16** දිනැති ලිපිය හා බැඳේ.

**02.** ඒ අනුව, දකුණු පළාත් සභාව මගින් වැටුප් ගෙවීමේ පදනම යටතේ වෙනත් පළාත් සභාවන් සඳහා තාවකාලික අනුයුක්තයන් ලබා දීම **2022.11.20** දින සිට ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවීමටත්, දැනටමත් මෙම සහනය භුක්ති විඳින නිලධාරීන් හට ලබා දී ඇති කාල සීමාව දීර්ඝ නොකිරීමටත්, මේ වන විට ලබා දී ඇති කාල පරිච්ඡේදය අවසන් වූ පසුව අප පළාත් සභාවේ නිත්‍ය සේවා ස්ථානය වෙත රාජකාරි සඳහා වාර්තා කළ යුතු බවට ඔවුන්ට දැනුම් දීමටත්, ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය **2022.11.18** දිනැතිව ලැබී ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

දීපිකා කේ. ගුණරත්න
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

ලිපිනය: පහළ ඩික්සන් පාර, ගාල්ල. | முகவரி: கீழ் டிக்சன் வீதி, காலி. | Address: Lower Dikson Road,Galle.
දුරකතන/ෆැක්ස්: 091-2234480 | தொலைபேசி/தொலைநகல்: 091-2234480 | Telephone/Fax: (+94)91-2234480
ඊ-මේල්: governsecspc@sltnet.lk | மின்-அஞ்சல்: governsecspc@sltnet.lk | e-mail: governsecspc@sltnet.lk
වෙබ් අඩවිය: governor.sp.gov.lk | இணையதளம்: governor.sp.gov.lk | e-mail: governor.sp.gov.lk